සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

25 S I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 12 - 2018**

විභාග අංකය .............................

## ලංකා ඉතිහාසය I

කාලය පැය එකයි

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. **සියලු** ප්‍රශ්න වලට **මෙම පත්‍රයේම** පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

- අංක **01** සිට **05** දක්වා ප්‍රශ්නවලට නම් **පහ** බැගින් දී ඇත. කුමන හෝ හේතුවක් මත එකක් අනෙක්වා සමඟ **නොගැළපේ** එම **නොගැළපෙන** පදයට හිමි අංකය අදාළ හිස්තැනෙහි ලියන්න.

1. 1. මලය දේශය 2. මධ්‍යම කඳුකරය 3. මායා දේශය
   4. ගිරිමණ්ඩලය 5. මේරුකන්දර (.....)

02. 1. ඔරුවල සන්නස 2. වල්ලිපුරම් සන්නස 3. අල්ලෙයි සන්නස
    4. පල්කුඹුර සන්නස 5. පණාකඩුව සන්නස (.....)

03. 1. උත්තිය 2. මහානාග 3. කාවන්තිස්ස
    4. යටාලතිස්ස 5. ගෝඨාභය (.....)

04. 1. සුභද්දා 2. ලෝකනාථා 3. සුමිත්තා
    4. සුගලා 5. රත්නාවලී (.....)

05. 1. දළදා සිරිත 2. සද්ධර්මරත්නාවලිය 3. පූජාවලිය
    4. කව්සිළුමිණ 5. විසුද්ධිමාර්ග සන්නය (.....)

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න වල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

06. 1. මාණාභරණ - දැදිගම
    2. සිරිවල්ලභ - උඩුන්දොර
    3. කිත්සිරිමේඝ - හන්තානාගොඩ
    4. දෙවන ගජබාහු - පුලත්ථිනගර
    5. ලෝකේශ්වර - මහානාගහුල (.....)

07. 1. සෙනපති - සේනාපති
    2. දෝවාරික - දණ්ඩනායක
    3. බඩගරික - භාණ්ඩාගාරික
    4. මහලේ - ලේකම්
    5. දමෙළ් අධිකාරී - දමිළ හමුදා ප්‍රධානී (.....)

08. 1. දෙවන බුවනෙකබාහු - ශ්‍රී නිවාස බුවනෙකබාහු
2. හතරවන පරාක්‍රමබාහු - පණ්ඩිත පරාක්‍රමබාහු
3. හතරවන විජයබාහු - බෝසත් විජයබාහු
4. හයවන බුවනෙකබාහු - සපුමල් කුමරු
5. හත්වන පණ්ඩිත පරාක්‍රමබාහු - අම්බුළුගල කුමරු (.....)

09. 1. ජම්බුද්‍රෝණිය - යාපනය
2. සුභ පබ්බත - යාපහුව
3. ජවර්ධන පුර - කෝට්ටේ
4. ගඟ සිරිපුර - ගම්පොළ
5. සෙංකඩගල - මහනුවර (.....)

10. 1. කළුදිය පොකුණ ලිපිය - භික්ෂූන් වහන්සේලාට ලබාදුන් උපදෙස් හා නීතිරීති
2. කුසලාන කන්ද ලිපිය - උපරජවරුන් හා ප්‍රාදේශීය රජවරුන් පිළිබඳ තොරතුරු
3. බදුල්ල ටැම් ලිපිය - වෙළඳ ගමක පාලනය පිළිබඳ තොරතුරු
4. තෝනිගල ලිපිය - ඇමති පරම්පරා පහක් පිළිබඳ තොරතුරු
5. වෙස්සගිරිය ලිපිය - වගා කල යුතු භෝග වර්ග පිළිබඳ තොරතුරු (.....)

- **අංක 11 - 15 තෙක් වූ ප්‍රශ්නය සඳහා x හා y තීරුවල නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් දී ඇත. y තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන දින වකවානු x තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. x තීරුව y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස්කළ විට පහත දී ඇති සංකේත පහෙන් එකක් නිවැරදිය. එම නිවැරදි අංකය තෝරා වරහන තුළ යොදන්න.**

11.

| | x | y |
|---|---|---|
| 1. | අමරාවතී සම්ප්‍රදාය | A මිනිසා හා අශ්වහිස |
| 2. | ගුප්ත කලා සම්ප්‍රදාය | B ශිව දේවාලය |
| 3. | පල්ලව කලා සම්ප්‍රදාය | C අවුකන පිළිමය |
| 4. | චෝළ කලා සම්ප්‍රදාය | D ගඩලාදෙණි විහාරය |
| 5. | විජයනගර් සම්ප්‍රදාය | E ඉසුරුමුණි පෙම් යුවල |

1. CABED 2. ACEDB 3. CAEBD
4. AECBD 5. CADEB (.....)

12.

| | x | y |
|---|---|---|
| 1. | වංසත්ථප්පකාසනී | A අනුරාධපුර යුගය |
| 2. | අමාවතුර | B පොළොන්නරු යුගය |
| 3. | බුදුගුණ අලංකාරය | C කෝට්ටේ යුගය |
| 4. | මයුර සංදේශය | D ගම්පොළ යුගය |
| 5. | මන්දාරම්පුර පුවත | E මහනුවර යුගය |

1. ABCDE 2. ABDCE 3. BACDE
4. ABCED 5. DECBA (.....)

13.

| | x | y |
|---|---|---|
| 1. | වෙරළාශ්‍රිත එළිමහන් කඳවුර | A අලිගල |
| 2. | පහතරට තෙත් කලාපීය ලෙන | B පතිරාජවෙල |
| 3. | පහතරට වියළි කලාපීය ලෙන | C බෙල්ලන් බැදි පැලැස්ස |
| 4. | පහතරට වියළිකලාපීය එළිමහන් කඳවුර | D බණ්ඩාරවෙල |
| 5. | කඳුකර එළිමහන් දඩයම් ස්ථාන | E බටදොඹලෙන |

1. EABCD 2. BECAD 3. ACBED
4. BEACD 5. CBEACD (.....)

14. x y

| | x | | y |
|---|---|---|---|
| 1. | දේවානම්පියතිස්ස රජු | A | අබ්බස්ථල දාගැබ |
| 2. | මහසෙන් රජු | B | සෝමාවතිය |
| 3. | සද්ධාතිස්ස රජු | C | දක්ඛිණගිරි විහාරය |
| 4. | මහාදාඨික මහානාග රජු | D | තිස්සාරාමය |
| 5. | ගිරිඅභය රජු | E | ගෝකණ්ණ විහාරය |

1. DEBCA 2. EDBAC 3. CABDE
4. DCEAB 5. DECAB (.....)

15. x y

| | x | | y |
|---|---|---|---|
| 1. | සෙංකඩගල පරාක්‍රම ඇපා | A | රාජාලංකා |
| 2. | නිශ්ශංක අලගක්කෝණාර | B | චන්‍ද්‍රභානු |
| 3. | වීර අලකේශ්වර | C | චෙංහෝ |
| 4. | හතරවන බුවනෙකබාහු | D | යෙහිපානයිනා |
| 5. | දෙවන පැරකුම් | E | ඉබන්බතුතා |

1. DACEB 2. CEBDA 3. DAECB
4. ADECB 5. CDABE (.....)

- **අංක 16 - 20 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.**

16. රාජධානි නිරිත දිගට විතැන්වීමේදී පිහිටවාගත් පාලන මධ්‍යස්ථායන්හි නිවැරදි අනුපිළිවෙළ දක්නට ඇති වරණය තොරන්න.
   1. දඹදෙණිය, කුරුණෑගල, යාපහුව, ගම්පොළ, කෝට්ටේ
   2. දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොල, කෝට්ටේ
   3. දඹදෙණිය, ගම්පොළ, යාපහුව, කුරුණෑගල, කෝට්ටේ
   4. කෝට්ටේ, දඹදෙණිය, යාපහුව, ගම්පොළ, කුරුණෑගල
   5. කෝට්ටේ, කුරුණෑගල, දඹදෙණිය, යාපහුව, ගම්පොළ (.....)

17. පහත සඳහන් ඓතිහාසික සිදුවීම් වල නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.
   1. චීන ආක්‍රමණය, කෝට්ටේ කොටුව ඉදිකිරීම, අධිවිරරාම පටුන ජයගැනීම, සේනාසම්මත වික්‍රමබාහුගේ කැරැල්ල, යාපාපටුන ජයගැනීම.
   2. කෝට්ටේ කොටුව ඉදිකිරීම, චීන ආක්‍රමණය, ආධිවිරරාම පටුන ජයගැනීම, යාපා පටුන ජයගැනීම, සේනා සම්මත වික්‍රමබාහුගේ කැරැල්ල
   3. චීන ආක්‍රමණය, අධිවිරරාම පටුන ජයගැනීම, කෝට්ටේ කොටුව ඉදිකිරීම, සේනාසම්මත වික්‍රමබාහුගේ කැරැල්ල, යාපාපටුන ජයගැනීම.
   4. චීන ආක්‍රමණය, අධිවිරරාම පටුන ජයගැනීම, කෝට්ටේ කොටුව ඉදිකිරීම, යාපා පටුන ජයගැනීම, සේනාසම්මත වික්‍රමබාහුගේ කැරැල්ල.
   5. කෝට්ටේ කොටුව ඉදිකිරීම, සේනාසම්මත වික්‍රමබාහුගේ කැරැල්ල, චීන ආක්‍රමණය අධිවිරරාම පටුන ජයගැනීම, යාපා පටුන ජයගැනීම. (.....)

18. පහත සඳහන් ඉදිකිරීම් වල ඓතිහාසික අනුපිළිවෙල ඇතුලත් වරණය තෝරන්න.
   1. කුරුණෑගල වැව, වත්තල විජයබා විහාරය, ගඩලාදෙනි විහාරය, ත්‍රිභාෂා ලිපිය, පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන
   2. කුරුණෑගල වැව, ගඩලාදෙනි විහාරය, වත්තල විජයබා විහාරය, ත්‍රිභාෂා ලිපිය, පැපිලියානේ සුනේත්‍රා දේවී පිරිවෙන
   3. පැපිලියානේ සුනේත්‍රා දේවී පිරිවෙන, වත්තල විජයබා විහාරය, කුරුණෑගල වැව, ගඩලාදෙණිය විහාරය, ත්‍රි භාෂා ලිපිය
   4. වත්තල විජයබා විහාරය, කුරුණෑගල වැව, ගඩලාදෙනි විහාරය, ත්‍රි භාෂා ලිපිය, පැපිලියානේ සුනේත්‍රා දේවී පිරිවෙන
   5. කුරුණෑගල වැව, ගඩලාදෙණිය විහාරය, වත්තල විජයබා විහාරය, ත්‍රි භාෂා ලිපිය, සුනේත්‍රාදේවී පිරිවෙන (.....)

19. කෝට්ටේ රාජධානියේ බලයට පත් පාලකයින්ගේ නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.
   1. ජයබාහු, හයවන බුවනෙකබාහු, හත්වන පණ්ඩිත පරාක්‍රමබාහු, අටවන වීර පරාක්‍රමබාහු, හත්වන විජයබාහු
   2. ජයබාහු, හත්වන පණ්ඩිත පරාක්‍රමබාහු, අටවන වීර පරාක්‍රමබාහු, හයවන බුවනෙකබාහු, හයවන විජයබාහු
   3. හයවන බුවනෙකබාහු, ජයබාහු, හත්වන පණ්ඩිත පරාක්‍රමබාහු, අටවන වීර පරාක්‍රමබාහු, හයවන විජයබාහු
   4. හයවන බුවනෙකබාහු, හත්වන පණ්ඩිත පරාක්‍රමබාහු, ජයබාහු, අටවන වීර පරාක්‍රමබාහු, හයවන විජයබාහු
   5. හයවන විජයබාහු, ජයබාහු, හයවන බුවනෙකබාහු, හත්වන පණ්ඩිත පරාක්‍රමබාහු, අටවන වීර පරාක්‍රමබාහු (.....)

20. පොළොන්නරු යුගයේ ඉතිහාසය හැදෑරීම සඳහා වැදගත්වන මූලාශ්‍රය පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
   1. පණාකඩුව සන්නස, සංගමු ලිපිය, රජගල ලිපිය, තංජෝර්ලිපිය, අඹගමු ලිපිය
   2. කල්‍යාණී ශිලා ලේඛණය, දෙවනගල ලිපිය, අර්පාක්කම් ලිපිය, තෝනිගල ලිපිය, බුදුමුත්තාව ලිපිය
   3. පොළොන්නරු පුවරුලිපිය, වේලක්කාර ලිපිය, බදුළුටැම් ලිපිය, අල්ලෙයි සන්නස, බෝපිටිය පුවරු ලිපිය
   4. දෙවනගල ලිපිය, පල්ලවරයායන් පෙට්ටෙ, මිනිපේ පුවරු ලිපිය, අල්ලෙයි සන්නස, දොරටියාව සන්නස
   5. රුවන්වැලි සෑ ලිපිය, පොළොන්නරු කතිකාවත, පඩුවස්නුවර ආසන ලිපිය, තෝනිගල ලිපිය, සිතුල්පව්ව ලිපිය (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නයේ පිහිටා තිබීම.
   1. ශ්‍රී ලංකාවේ ආර්ය ජනවාස පිහිට වීම.
   2. වරින් වර ලංකාවට ආක්‍රමණ එල්ලවීමට හේතු වීම.
   3. ලංකාවේ පාලකයින් ඉන්දියාවෙන් යුධ ආධාර ලබාගැනීම.
   4. ශ්‍රී ලංකාව ස්වාධීන රාජ්‍යයක් ලෙස වර්ධනය වීම.
   5. ඉන්දියාව පාළකයින් ශ්‍රී ලංකාවේ රැකවරණය ලැබීම. (.....)

22. පූර්ව ඓතිහාසික යුගයේ තාක්ෂණය
   1. එදිනෙදා අවශ්‍ය කරන මෙවලම් හා උපකරණ තනාගැනීම සඳහා පීඩන ශල්කනය යොදාගන ඇත.
   2. ශිලා මෙවලම් තාක්ෂණයෙන් මිදී යකඩ තාක්ෂණයට යොමුවීම.
   3. සකපෝරුව භාවිතයෙන් මැටි බඳුන් නිපදවා ඇත.
   4. තඹ ලෝහය භාවිතා කරමින් පබළු නිපදවා ඇත.
   5. මෙරට නිපදවූ කාලරක්ත වර්ණ මැටිබඳුන් ඉන්දියානු මැටි බඳුන් හා සමාන වේ.

   (.....)

23. රෝහණ රාජවංශය
   1. මහානාම යුව රජු රෝහණ රාජවංසයේ ආරම්භකයා වේ.
   2. ගෝඨාභය රජු දසබෑ රජවරුන් පරාජයට පත් කරන ලදි.
   3. කාකවණ්ණ තිස්ස රජු කැළණි රජ පෙළපත සමඟ විවාහ සබඳතා ඇතිකරගන්නා ලදි.
   4. රෝහණය තුළ ඒකීය පාලනයක් බිහිකිරීමට කාවන්තිස්ස රජුට හැකිවිය.
   5. රෝහණ රාජවංශයේ දුටුගැමුණු රජු ලංකාවට පළමුවරට එක්සත් කරන ලදි. (.....)

24. හතරවන පැරකුම් රජු,
   1. දිවයිනේ ශාසනික හා ශාස්ත්‍රිය උන්නතියක් ඇති වූ අවධියකි.
   2. දෙවින්දර දෙමහල් විහාරයක් ඉදිකිරීම.
   3. මහනුවර මල්වතු මහා විහාරය කරවීම.
   4. මෙතුමාගේ අවධියේදී පන්සිය පනස් ජාතක පොත් වහන්සේ රචනා කරන ලදි.
   5. දඹදෙණි රජ පෙළපතේ අවසන් පාලකයා ය. (.....)

25. කෝට්ටේ යුගයේ අධ්‍යාපනය
   1. කෝට්ටේ අධ්‍යාපනික සාහිත්‍ය අතින් ස්වර්ණමය යුගය හයවන පැරකුම් යුගයයි.
   2. කැරගල පද්මාවතී, පැපිලියාගේ සුනේත්‍රා දේවී වැනි අධ්‍යාපන ආයතන රැසක් දියුණුව පත්විය.
   3. වනවාසී හා ග්‍රාමවාසී භික්ෂූන් විසින් තරගකාරීව ග්‍රන්ථකරණයේ නිරත වීම.
   4. සංදේශ කාව්‍ය රචනා කිරීම කෝට්ටේ යුගයේ ආරම්භ වීම.
   5. කෝට්ටේ යුගයේ දී අධ්‍යාපනය දියුණුවට පත්වීම නිසා ශ්‍රී රාමචන්ද්‍ර භාරති වැනි පඬිවරුන් එකල ලංකාවට පැමිණ ඇත. (.....)

- **ප්‍රශ්න අංක 26 - 30 දක්වා එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති A, B, C, D යන ප්‍රතිචාර හතර අතරින් එකක් හෝ කීපයක් හෝ නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,**

   A හා B නිවැරදි නම් අංක **1** ද  B හා C පමණක් නිවැරදි නම් අංක **2** ද
   C හා D පමණක් නිවැරදි නම් අංක **3** ද  A හා C පමණක් නිවැරදි නම් අංක **4** ද

   ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි ගණනක් නිවැරදි නම් අංක 5 ද වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | Aහා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් නිවැදිය. |

26. ශ්‍රී ලංකාවේ වරායන් සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
   A) අතීත පාලකයන් වරායන් හරහා විදේශ සබඳතා පවත්වන ලදි.
   B) පළමු විජයබාහු රජතුමා විසින් මාතොට වරාය ආශ්‍රිතව මුහුදු සංචාරක මුරපොළෙක් අරඹන ලදි.
   C) මහා වාලුකානදී මුවදොර මහා තිත්ථ වරාය පිහිටා ඇත.
   D) දන්ත කුමරු හා හේමමාලා කුමරිය ගෝකණ්ණ වරාය හරහා දළදා වහන්සේ ලංකාවට වැඩම කරනවන ලදී. (.....)

27. සපුමල් කුමරු සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේද?
   A) චම්පක පෙරුමාල් නමින් ද හැඳින්වේ.
   B) හයවන පැරකුම් රජුගේ පුත්‍රයා වේ.
   C) යාපා පටුන ජයගැනීමේ සටන මෙහෙයවන ලදී.
   D) සිංහල සංගය මර්දනය කිරීම (.....)

28. දඹදෙණි යුගයේ සාහිත්‍ය කටයුතු සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
   A) තුන්වන විජයබා රජතුමා විසින් කව්සිළුමිණ රචනාකරන ලදි.
   B) මේධංකර හිමියන් විසින් රචිත 'ප්‍රයෝග සිද්ධි' මේ යුගය රචිත සංස්කෘත ග්‍රන්ථයකි.
   C) ධර්මසේන හිමියන් විසින් සද්ධර්මරත්නාවලිය රචනා කරන ලදි.
   D) දේව පතිරාජයන් මෙම යුගයේ සිටි ප්‍රසිද්ධ උගතෙකි. (.....)

29. පොළොන්නරු යුගයේ කාන්තා නායකත්වය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?

A) සුගලා දේවිය පොළොන්නරුවේ සිට රාජ්‍ය මෙහෙය වන ලදි.

B) පළමු පැරකුම් රජුගේ මෙහෙසිය වූ ලීලාවතී තෙවරක් රාජ්‍යත්වයට පත්විය.

C) නිශ්ශංකමල්ල රජුගේ මෙහෙසිය වූ කල්‍යාණවතී රැජිනද පොළොන්නරුවේ රජ පදවියට පත්විය.

D) ලීලාවතී රැජිනගේ අවධියේදී චෝළයින් තෙවරක් ලංකාව ආක්‍රමණය කරන ලදි. (.....)

30. ථෙරවාදී බුදු දහම

A) මහායානය යනුවෙන් ද හඳුන්වනු ලැබේ.

B) ශ්‍රී ලංකාවට ථෙරවාදී බුදුදහම හඳුන්වාදෙනු ලැබුවේ. මිහිඳු හිමියන් විසිනි.

C) මහා විහාරය ථෙරවාදී සම්ප්‍රදායේ මූලස්ථානයයි.

D) හින්දු දහමේ කොටස් ද සම්මිශ්‍රණය වී ථෙරවාද බුදුදහම නිර්මාණය වී ඇත. (.....)

- **අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. භෂ්මාවශේෂ තැන්පත් කළ මැටි බඳුන් විශාල මැටි බඳුනක බහා තැම්පත් කිරීමේ සුසාන ක්‍රමය හඳුන්වන නම කුමක්ද?

1. ශිලා මංජුසා 2. මැටි ඔරු 3. හරණී
4. වලක්‍රමය 5. විස්තෘත ක්‍රමය (.....)

32. මහාමේඝ උයන කරවූ පාලකයා කවුරුන් ද?

1. මුටසිව රජු 2. පණ්ඩුකාභය රජු
3. දේවානම්පියතිස්ස රජු 4. උත්තිය රජු
5. සද්ධාතිස්ස රජු (.....)

33. චෙන් - හෝ සෙනෙවියා විසින් ලංකාව ආක්‍රමණය කරන සමයේ රයිගම පාළකයා කවුරුන්ද?

1. ප්‍රභුරාජ නිශ්ශංක අලගක්කෝණාර 2. තුන්වන වික්‍රමබාහු
3. පස්වන පැරකුම් 4. වීර අලකේශ්වර
5. ළමැනි ජය මහලැණ (.....)

34. මූලාශ්‍රවල සඳහන් පරිදි ලංකාවේ පළමු පෞද්ගලික ආරාම පූජාව කුමක්ද?

1. මහාවිහාරය 2. අභයගිරිය 3. ජේතවනය
4. ලංකාරාමය 5. දක්ෂිණ විහාරය (.....)

35. සියබස්ලකර නම් ඉපැරණි කාව්‍ය ග්‍රන්ථයේ රචකයා කවුරුන්ද ?

1. දෙවන පැරකුම් රජු 2. හයවන පැරකුම් රජු 3. වැත්තෑවේ හිමියන්
4. රණස්ගල්ලේ හිමි 5. සිව්වන සේන රජු (.....)

- අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ **දෙක** බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4, සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ **අංකය තිත් ඉර මත** ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| **පළමු වැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|
| 36. ඇරිස්ටෝටල් ඉතිහාසයේ පියා ලෙස හැඳින්වේ. | තැනිතලා ප්‍රදේශවල පිහිටි ශේෂ කඳු පදනම් කරගෙන පරිපාලන මධ්‍යස්ථාන බිහිවිය. (.....) |
| 37. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් ඉතිහාසගත කරුණු තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි ලබාගත හැකිය. | පළමුවන පැරකුම් රජුට අයත් දෙවනගල ලිපියෙන් එතුමාගේ බුරුම ආක්‍රමණය පිළිබඳ තොරතුරු අනාවරණය වේ. (.....) |
| 38. පස්වන මිහිඳු රජුගේ පුත් කස්සප කුමරු වික්‍රමබාහු නමින් රජරට රාජ්‍යත්වයට පත්විය. | පළමුවන විජයබාහු රජු සියම් දේශයෙන් භික්ෂූන් වැඩම කොට නැවත ලංකාවේ උපසම්පදාව පිහිටවන ලදි. (.....) |
| 39. හයවන පැරකුම් රජුට පසුව ඔහුගේ දියණියගේ පුත්‍රයා දෙවන ජයබාහු නමින් කෝට්ටේ රාජ්‍යත්වය පත්විය. | ගාල්ලේ පිහිටා ඇති ත්‍රිභාෂා ලිපිය චීන, පර්සියා, හා දෙමළ අක්ෂරවලින් රචනාකර ඇත. (.....) |
| 40. සපුමල් කුමරුගේ පියා මලබාර් දේශයෙන් පැමිණි පණික්කිල නම් ද්‍රවිඩ ජාතිකයෙකු බව පෘතුගීසි මූලාශ්‍රවල සඳහන් ෙ.වි | දෙවන පැරකුම් රජු විසින් පෙළොන්නරු කතිකාවත කරවන ලදි. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

25 S II

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 12 - 2018

විභාග අංකය .............................

# ලංකා ඉතිහාසය II

කාලය පැය දෙකයි

උපදෙස්

- පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

01. ඔබට සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමති දෙකක් පිළිබඳව ඓතිහාසික කෙටි සටහන් ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1. උතුරු මැද පළාත | 2. කෝට්ටේ | 3. රයිගම | 4. මඩකලපුව |
| 5. සුරුල්ලවාපී | 6. කලාඔය | 7. කුරුණෑගල | 8. මිනිහාගල්කන්ද |

(නිවැරදි ලකුණු කිරීමකට හා නම් කිරීමකට ලකුණු 1 බැගිනි. කෙටි ඓතිහාසික සටහනට ලකුණු 5 බැගිනි)

02. 'ඉතිහාසය යනු මිනිසාගේ අතීතය පිළිබඳ අධ්‍යයනයයි' යන ක්‍රිස් හර්ට්ස්ගේ ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස් විවේචනාත්මකව ඉදිරිපත් කරන්න. (ල. 14)

03. ශ්‍රී ලංකාවේ බාහිර භූගෝලීය පිහිටීමේ ලක්ෂණ සැකෙවින් විස්තර කොට එම ලක්ෂණ ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැඩගැසීම කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳ විමසුමට ලක්කරන්න. (ල. 14)

04. ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී මහා වංසය ඉතා වැදගත්වේ. ඉතිහාසය හැදෑරීම සඳහා මහා වංසය යොදාගැනීමේදී ඉස්මතුවන ප්‍රබලතා හා දුබලතා පිළිබඳ විග්‍රයක යෙදෙන්න. (ල. 14)

05. ඓතිහාසික යුගය යන්න හඳුන්වා එම යුගයේ ජනාවාස වල ස්වරූපය හා ජීවන රටාව පිළිබඳ අධ්‍යයනයක යෙදෙන්න. (ල. 14)

06. මහා පැරකුම් රජුගේ දේශපාලන, ආර්ථික හා සංස්කෘතික කාර්ය සංසිද්ධීන් පිළිබඳ සමාලෝචනය කරන්න. (ල. 14)

07. රජරට ශිෂ්ටාචාරයේ පරිහාණියට හා බිඳවැටීමට බලපෑ සාධක පිළිබඳ විමසුමක යෙදෙන්න.

08. එක්කෝ (A) කොටසට නැතහොත් (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.

(A) දෙවන පැරකුම් අවධියේ වැදගත්කම විස්තර කරන්න.

(B) කෝට්ටේ හයවන පැරකුම් රාජ්‍ය කාලයේ දේශපාලන හා සංස්කෘතික වැදගත්කම විස්තර කරන්න. (ල. 14)

09. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව ඓතිහාසික සටහන් ලියන්න.


1. විජයබා කොල්ලය
2. පශ්චාත් පොළොන්නරු යුගයේ සාහිත්‍ය කටයුතු
3. අලගක්කෝණාර පරපුර
4. වාරි තාක්ෂණය

(7 x 2 = 14)

# තෙවන වාර පරීක්ෂණය - 2018
## ලංකා ඉතිහාසය - 12 ශ්‍රේණිය
### පිළිතුරු පත්‍රය - 1 කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 3 | 11. | 3 | 21. | 4 | 31. | 3 |
| 2. | 2 | 12. | 1 | 22. | 1 | 32. | 1 |
| 3. | 1 | 13. | 4 | 23. | 1 | 33. | 4 |
| 4. | 4 | 14. | 5 | 24. | 3 | 34. | 2 |
| 5. | 1 | 15. | 1 | 25. | 4 | 35. | 5 |
| 6. | 5 | 16. | 2 | 26. | 1 | 36. | 4 |
| 7. | 2 | 17. | 2 | 27. | 4 | 37. | 5 |
| 8. | 5 | 18. | 4 | 28. | 3 | 38. | 3 |
| 9. | 1 | 19. | 1 | 29. | 5 | 39. | 2 |
| 10. | 4 | 20. | 4 | 30. | 2 | 40. | 1 |

II කොටස



01. නිවැරදි ලකුණු කිරීමට හා නම් කිරීමකට ලකුණු 1 බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 5 බැගිනි. මුළු සංඛ්‍යාව ලකුණු 18 කි.

02. * ඉතිහාසය යන්න සඳහා ඉදිරිපත්ව ඇති නිර්වචනය
* ඉතිහාසය මගින් අධ්‍යනය කරනු ලබන විෂය පරාසය හඳුන්වා දීම.
* ඉතිහාසය අධ්‍යනය කිරීම යනු අතීතයේ මිනිසා කළ කී හා අතීතයේ සිදුවූ දෑ පිළිබඳ අධ්‍යනය කිරීමක් බව උදාහරණ දෙමින් විස්තර කර දීම.
* ඉතිහාසය මගින් මානවයාගේ බිහිවීම, පරිනාමය, පිළිබඳවත් ඔවුන් අතීතයේ කළ කී දෑ අධ්‍යයනය කරන බව.
* ඉතිහාසය යනු මිනිසාගේ අතීතය පිළිබඳ අධයනයකි යන්නට පක්‍ෂව හා විපක්‍ෂව විවේචනාත්මක ලෙස කරුණු ඉදිරිපත් කිරීම. (ල. 14)

03. * ශ්‍රී ලංකාව අවට භූගෝලීය ලක්‍ෂණවලට සාපේක්‍ෂව ශ්‍රී ලංකාව පිහිටා ඇති ආකාරය බාහිර භූගෝලීය පිහිටීම බව.
* බාහිර භූගෝලීය පිහිටීමේ ප්‍රධාන ලක්‍ෂණ
01. ඉන්දියාවට ආසන්නව පිහිටීම. 02. ඉන්දියාවෙන් වෙන්ව දූපතක් ලෙස පිහිටා තිබීම.
03. ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටා තිබීම.
* ඉහත ලක්‍ෂණ ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැඩගැනීම කෙරෙහි බලපෑ ආකාරය උදාහරණ ගෙන එමින් විස්තර කර තිබීම.
* ඉන්දියාවට ආසන්නව පිහිටා තිබීම. * ආර්යා ජනවාස පිහිටවීම.
* වරින්වර එල්ල වූ ආක්‍රමණ හා සංක්‍රමණ * ආධාරක සේනා ලබාගැනීම.
* අධාරක සේනා ලබා ගැනීම. * විවාහ සබඳතා
* ඉන්දියාවෙන් ලද ආභාෂයන් ( ආගම, කලාශිල්ප, ගෘහනිර්මාණ)
* ඉන්දියාවෙන් වෙන්ව දූපතක් ලෙස පිහිටා තිබීම. * ස්වාධීන රාජ්‍යයක් ලෙස වර්ධනය වීම.
* ශ්‍රී ලංකාවටම ආවේණික සභ්‍යත්වයක් බිහිවීම.
* මුස්ලිම්, හූණ, ශකවැනි ආක්‍රමණයක් ලංකාවට ඍජු ලෙස බල නොපෑම.
* ථෙරවාද බුදු දහම සුරක්‍ෂිත වීම. (ල. 7)

04. මහාවංසය හැඳින්වීම.
**ප්‍රබලතා**
* අඛණ්ඩ දේශපාලන ඉතිහාසයක් හැදෑරීමේ දී වැදගත්ම මූලාශ්‍රය වීම.
* ඉතිහාසය පිළිබඳ විවිධ තොරතුරු අණාවරණය කරගතහැකිවීම.
* දේශපාලන, ආගමික, සාමාජීය හා සංස්කෘතික, ආර්ථික තොරතුරු,
ඉහත කරුණු උදාහරණ ගෙන දෙමින් විස්තර කර තිබීම.
**දුබලතා**
* ඉතිහාස ග්‍රන්ථයක් නොවීම.
* මූලාශ්‍රය රචනාකිරීමේදී මුල් වූ තොරතුරු තුන් ආකාරයකින් සංශෝධනය කිරීම නිසා ඇතැම් කරුනු ගිලිහී යාමටත් අනවශ්‍ය කරුණු එක්වීමටත් හේතුවීම.
* කතුවරයාගේ රුචි අරුචිකම් අන්තර්ගත වීම.
* ප්‍රදේශීය රාජ්‍යයන් පිළිබඳ තොරතුරු ප්‍රමාණවත්ව සඳහන් නොවීම.
* මහා විහාරයට අනුග්‍රහය දැක්වූ දේවානම්පියතිස්ස දුටුගැමුණු වැනි චරිත අතිශයෝකිතයෙන් වර්ණ කිරීම හා මහා විහාරයට විරුද්ධ වූ ශ්‍රේෂ්ඨ රජ වරුන්ගෙන් චරිත ඉස්මතු නොකිරීම.
* අතිශයෝක්තිය හා අනවශ්‍ය වර්ණනා අඩංගු වීම.
* අත්භූත ජනක සිදුවීම් අන්තර්ගත වීම. (ල. 14)

05. ක්‍රි.පූ. 600 - 500 අතර කාලනිමාවේදී ඓතිහාසික යුගය ආරම්භ වන බව ඓතිහාසික යුගයේ මුල් අවධිය මූල ඓතිහාසික යුගයේ මුල් අවධිය මූල ඓතිහාසික යුගය ලෙස සැලකෙන බව විස්තර කිරීම. (ක්‍රි.පූ. 4 - 3)
**ජනාවාස වල ස්වරූපය**
* ආර්ය සංක්‍රමණය (වරින් වර ඉන්දියාවේ විවිධ ප්‍රදේශවල සිට ලංකාවේ විවිධ ප්‍රදේශවලට)
* අර්ය සංක්‍රමණය පෙර ලංකාවේ විසූ යක්‍ෂ, නාග, දේව, රාක්‍ෂ යන ස්වදේශික ජනයා විසූ බව
* ආර්ය සංක්‍රමණය පිළිබඳ තොරතුරු සපයාගත හැකි සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර පිළිබඳ තොරතුරු

* ආර්යන් ලංකාව පැමිනීමට පෙර කෘෂිකර්මය පදනම් කරගත් ලෝහ තාක්ෂණය පිළිබඳ දැනුමක් පිරිසක්
* සිටි දියුණු සමාජයක් පැවතිබව පුරා විද්‍යාත්මක මූලාශ්‍ර මගින් තහවුරු වන බව.
*ලංකාවේ පිහිට වූ ආර්ය ජනවාස
* වැවක් කේන්ද්‍රකරගෙන වාපී ගම්මාන බිහිවීම.
* වැව, කුඹුරු, සේන, කැලෑව, හා නිවාස ගමක ප්‍රධාන ලක්ෂණ බව.
*ගමක පවුල් 5 - 25 ක් අතර ප්‍රමාණයක් තිබූ බව.
* පවුලේ ප්‍රධානියා ගෘහපති බව.
*ගමේ ප්‍රධානියා ගමික බව
*ගම් ඒකාබද්ධ වී දසගම්, ගම්වැව් පද්ධති, නගර ප්‍රාදේශීය රාජ්‍ය හා රාජ්‍ය දක්වා වර්ධනය වීම.
* ජනගහනයේ වර්ධනයක් සමඟ විශාල ප්‍රමාණයේ වැව් ඉදිකිරීම හා වාරි නිර්මාණ සඳහා අනුග්‍රහය ලැබීම.
* ක්‍රි.ව. තුන්වන ශතවර්ෂය වන විට අනුරාධපුරය පසු කරගත් මධ්‍යගත පාලනයකට අවශ්‍ය පසුබිම සකස් වූ ආකාරය.

**ජීවන රටාව**
* මුල් කාලයේ දී හේන්වගාවට යොමුවීම.
* පසු කාලීනව කුඹුරු හා ගොඩ ගොවිතැනට හා සත්ව පාලනයට නැඹුරු වීම.
* එදිනෙදා අවශ්‍යතා ඉටුකරගැනීමට අවශ්‍ය උපකරණ හා මෙවලම් තනාගැනීම සඳහා විවිධ කර්මාන්ත බිහිවීම.
* මදුරාපුර කුමරිය හා සංඝමිත්තා තෙරණිය සමඟ ලංකාවට සංක්‍රමණය වූ විවිධ වෘත්තීන්ට අයත් විවිධ කුළ වල පිරිස් නිසා කර්මාන්ත දියුණුව පත්වීම.
* වෘත්තීය අනුව ගම් හැඳින්වීම. (ල. 14)

06. **දේශපාලන**
* පියාගෙන් ලද උරුමයන් කිත්සිරිමේඝයන්ගේ මග පෙන්වීමක් යටතේ දක්ෂිණ දේශයේ පාලකයා බවට පසු වූ බව. එහි අගනගරය ලෙස පරාක්‍රමපුරය හෙවත් පඬුවස්නුවර ගොඩනැගීම.
* රජරට ජයගීම සඳහා දෙවන ගජබාහු සමඟ සිදුකළ සටන් ව්‍යාපාර
* දිවයින එක්සත් කිරීම සඳහා තම ඥාතීන් අතර සිදු වූ සටන්
* රුහුණු ජයගැනීම.
* දෙවන ගජබාහු සමඟ ඇතිවූ දේශපාන සම්මුතිය - සංගමු ලිපිය
* බුරුමය හා පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය

**ආර්ථික**
* දක්ෂිණ දේශයේ පාලකයා ලෙස පචාවැව හෙවත් බෑනා සමුද්‍රය කරවීම.
* දැදුරු ඔය ස්ථාන තුනකින් හරක් කර කොට්ඨබද්ධ, සූඛරතිජ්ජර, දෝරදන්තික නමින් අමුණු තුනක් බඳවා වගාවට අවශ්‍ය වැටුප් ලබාගැනීම.
* රජරට පාලකයා ලෙස පරාක්‍රම සමුද්‍රය ඉදිකිරීම.
* අභාවයට ගිය වැව් අමුණු ප්‍රතිසංස්කරණය
* ආගමික හා සංස්කෘතික
* පෙළොන්නරු කතිකාවක කරවීම.
* ජේතවනය, තිවංක පිළිමගෙය, ගල් විහාරය, දෙමළ මහා සෑය වැනි වෙහෙර විහාර ඉදිකිරීම.

07. රජරට ශිෂ්ටාචාරය යන්න අර්ථ දැක්වීම. (අනුරාධපුර, පොළොන්නරු රාජධානි)

**අනුරාධපුර රාජධානියේ පරිහානියට හා බිඳවැටීම.**
* දුර්වල පාලකයින් බලයට පත්වීම.
* මෞර්ය ලම්භකර්ණ පෙළපත් අතර ඇති වූ ගැටුම්
* විදේශීය ආක්‍රමණ
* දකුණු ඉන්දීය කුලී භේවායන්ගේ ක්‍රියා කලාපය
* වාරිකර්මාන්ත බිඳ වැටීම.
* චෝළ ආක්‍රමණ

**පෙළොන්නරු රාජධානිය බිඳ වැටීම.**
* අවසාන සමයේ දුර්වල පාලකයින් බලයට පත්වීම.
* පරාක්‍රමබාහු රජු ගෙන ගිය දැඩි කේන්ද්‍රීය පාලනය ඉදිරියට ගෙන යාමට සමත් දක්ෂ පාලකයින් නොමැති වීම.
* පැරකුම් රජුගේ යුධ සෙනෙවිවරුන්ගේ ක්‍රියාකලාපය
* රාජ්‍ය බලය ලබාගැනීම සඳහා කාලිංඝ හා පාණ්ඩ්‍ය පෙළපත් අතර ඇති වූ තරගය
* ආර්ථිකය බිඳවැටීම
* කාලිංග මාඝගේ ආක්‍රමණය

08. (A) චන්ද්‍රභානුගේ පළමු ආක්‍රමණය මර්ධනය කිරීම පිළිබඳ තොරතුරු

* 1247 දී රජුගේ එකොළොස්වන රාජවංශයේදී ආක්‍රමණය එල්ල වූ බව. * චන්ද්‍රබාහු තාමුලිංග දේශයේ (ලීගෝර් ) වැසියෙක් බව. * පැරකුම් රජුගේ බෑන වූ වීරබාහු කුමරු එම ආක්‍රමණය මර්ධනය කළ බව. * පරාජය පත් චන්ද්‍රභානු ආපසු ගියබවක් හෝ නොගිය බවක් ස්ථිර නැතිබව. *

**කාලිංග මාඝ පරාජය කිරීම පිළිබඳ තොරතුරු**

* පාණ්ඩ්‍ය අධිරාජ්‍යයේ වත්මන් සුන්දර පාණ්ඩ්‍ය රජුගේ ආධාරය ලබාගත් බව.
* ක්‍රි.ව. 1255 දී පමණ කාලිංඝ මාඝ පරාජයට පත් කළ බව.
* මාඝ පරාජය පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් තොරතුරු

**චන්ද්‍රභානුගේ දෙවන ආක්‍රමණ පිළිබඳ තොරතුරු**

* චන්ද්‍රභාහු දළදා වහන්සේ ඉල්ලා සිටි බව. * ජටාවර්මගේ වීර පාණ්ඩ්‍ය රජුගේ කුඩුමියාමලෙයි ලිපියේ සඳහන් තොරතුරු * පැරකුම්රජු පාණ්ඩ්‍ය රාජ්‍යයේ පාලනයෙන් චන්ද්‍රභාහු පරාජයට පත්කිරීම. * චන්ද්‍රභානුගේ පුතෙකුට යාපනයේ පාළනය බාර දීම. * දෙවන පැරකුම් රජු පොලොන්නරුවේදී නැවත අභිෂේක උත්සවයක් පැවැත්වීම.

**ආගමික සේවය විස්තර කිරීම.**

* දළදා වහන්සේ දඹදෙණියට වැඩම කිරීම. * දඹදෙනි කතිකාවක කරවීම. * පොළොන්නරු නගරය ප්‍රතිසංස්කරණය කිරීම. * මහවැලි ගඟේ දාස්කොටේ දී උපසම්පදා උත්සවයක් පැවැත්වීම. * වනවාසි භික්ෂු පරපුර පිහිටුවීම. * කැළණිය, ගලපාත, බෙලිගල, වාරිගල වැනි වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය රත්නපුර සමන් දේවාලය ඉදිකිරීම.

**අධ්‍යාපනික හා සාහිත්‍ය සේවා**

* රජු උගතෙකු බවත් උගතුන් සාහිත්‍යකරණයට පොළඹවා රජුද සාහිත්‍යකරණයේ නිරත වූ බව. * පිරිවෙන් ඉදිකිරීම. * විදේශයන්ගෙන් උගත් භික්ෂූන් වැඩමවා පොතපත ලිවීමට අනුග්‍රහ දැක්වීම.

(B) කෝට්ටේ රාජධානියේ ආරම්භක පාලකයා බව. * පැරකුම් රජුගේ මව / පියා පරපුර ආදී තොරතුරු * ශ්‍රී ලංකාව අවසාන වතාවට එක්සේසත් කළ බව. * යාපන රාජ්‍ය ජයගැනීම. * දකුණු ඉන්දීයාවේ අද්විරරාම පටුන ආක්‍රමණය * ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය (ශ්‍රී පාදය, ගඩලාදෙණිය, ලංකාතිලකය) * රජු සේම උගතුන් ග්‍රන්ථකරණයෙන් නිරත වීම ආදී තොරතුරු

09. **විජයබා කොල්ලය :-** හයවන විජයබා රජුගේ ක්‍රියාකලාපය.

* රජුගේ පුතුන් දෙදෙනෙකු වු බුවනෙකබාහු, මායාදුන්න, පරරාජසිංහ කුමරුන් රජු මරා රාජ්‍ය පැහැරගත් අයුරු
* කෝට්ටේ රාජ්‍ය කොටස්වලට බෙදී ගිය අයුරු

**පශ්චාත් පොළොන්නරු යුගයේ සාහිත්‍ය කටයුතු :-** දඹදෙණි, කුරුණෑගල, ගම්පොල හා කෝට්ටේ යුගවලද සිදුවූ අධ්‍යාපන සංවර්ධනය හා සාහිත්‍ය කටයුතු වල සිදුවූ සංවර්ධනය හා රාජ්‍ය අනුග්‍රහය පිළිබඳ නිදසුන් සපයමින් විස්තර කර තිබීම.

**අලගක්කෝනාර පරපුර:-** *ගම්පොල රජවාසල සේවය කළ ධනවත් පිරිසක් බව.
* ඉන්දියාවේ කේරළ දේශයේ පිහිටි වචී පුරයේ සිට ලංකාවට පැමිණි බව.
* නිශ්ශංක අලගක්කෝණාර පෙර පරපුර පිළිබඳ තොරතුරු
*තුන්වන වික්‍රමබාහුගේ අග්‍ර මන්ත්‍රිවරයා ලෙස නිශ්ශංක අලගක්කෝණාර සේවය කළ බව.
* නිශ්ශංක අලගක්කෝණාර වික්‍රමබාහුගේ සහෝදරිය විවාහ කරගත්බව.
* කෝට්ටේ කොටුව ඉදිකිරීම.
* නිශ්ශංක අලගක්කෝණාර සහෝදරියගේ පුතුන් රාජ්‍ය බලය ලබාගත් බව.
* වීර අලගක්කෝණාර රයිගම පාලනය ගොඩනගු බව.
* චීන ආක්‍රමණිකයන් විසින් වීර අලකේශ්වර චීනයට සිරකරුවන් ලෙස ගෙන ගිය බව.

**වාරිතාක්ෂණය :-** වැවක අංග නම්කර ඒ හා සම්බන්ධ තාක්ෂණික අංග පිළිබඳ විස්තරකර තිබිය යුතුයි.